# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2009 අංක 58 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 ඔක්තෝබර් මස 16 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 ඔක්තෝබර් මස 16 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. **6.50 යි.** තැපැල් ගාස්තුව **:** රු. **5.00 යි.**

## 2009 අංක 58 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2009 ඔක්තෝබර් මස 16 වන දින]

එල්.ඩී.—ඕ. 3/2009.

### 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2009 අංක 58 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 7 වන වගන්තියේ (4) වන, (5) වන, (6) වන සහ (7) වන උපවගන්ති ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1981 අංක 1 දරන පනතේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(4) (අ) මැතිවරණ කාර්යය සඳහා පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස සලකනු ලැබීමට එවකටත් හිමිකම් ලබා ඇති දේශපාලන පක්ෂයක් නොවන යම් පක්ෂයක ලේකම්වරයාට (ඈ) සහ (ඉ) ඡේදවල විධිවිධානවලට යටත්ව, මැතිවරණ කාර්යය සඳහා පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස ඒ පක්ෂය සලකනු ලැබීම සඳහා ඒ පක්ෂය වෙනුවෙන් ලියවිල්ලකින් වූ ඉල්ලීමක්, ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කාල සීමාවක් තුළ දී, කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස නියම කරමින් එක් එක් වර්ෂයේ ජනවාරි මස තිස් එක් වන දිනට පෙර කොමිෂන් සභාව විසින් දැන්වීමක් පළ කළ යුතු ය. ඒ පක්ෂය එසේ සලකනු ලැබුවහොත් වෙන්කර ගනු ලැබීමට ඒ පක්ෂය අපේක්ෂා කරනු ලබන්නේ අනුමත කරන ලද ලකුණු අතරින් කවර ලකුණක් ද යන වග ඒ ඉල්ලීමෙහි නිශ්චිතව සඳහන් විය යුතු ය.

(ආ) කොමිෂන් සභාව විසින්, සෑම ලිත් වර්ෂයක ම ආරම්භයේ දී මැතිවරණ කාර්යය සඳහා පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස සලකනු ලැබීමට හිමිකම් ලබා ඇති සෑම දේශපාලන පක්ෂයක ම නම් ඇතුළත් වන ලැයිස්තුවක් නිවේදනයක් මගින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(ඇ) (අ) ඡේදය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවේ දී, දේශපාලන පක්ෂයක ලේකම්වරයකු විසින් ඒ පක්ෂයේ ව්‍යවස්ථාවේ පිටපතක් ද, ඒ පක්ෂයේ නිලධාරීන්ගේ ලැයිස්තුවක් ද, විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශයක් ද, ඒ පක්ෂයේ තත් කාලීන ප්‍රතිපත්ති ප්‍රකාශයේ පිටපතක් ද කොමිෂන් සභාව වෙත සැපයිය යුතුය.

2-PL 004301 —3,490 (2009/08)

(ඇ) දේශපාලන පක්ෂවල හා දේශපාලනයෙහි කාන්තාවන්ගේ වඩාත් හොඳ නියෝජනයක් ඇතිවන බවට සහතික වීම සඳහා සෑම දේශපාලන පක්ෂයක් ම ඒ පක්ෂයේ නිලධාරීන්ගේ ලැයිස්තුවට කාන්තා නිලධාරීන් එක් අයකු හෝ ඊට වැඩි දෙනකු ඇතුළත් කිරීමට වග බලා ගත යුතු ය.

(ඉ) පහත දැක්වෙන කාල සීමාවලින් කවර හෝ කාලසීමාවක් ඇතුළත යම් අවස්ථාවක, පිළිගනු ලැබීම සඳහා දේශපාලන පක්ෂවලින් ඉල්ලුම් පත් කැඳවීමට කොමිෂන් සභාවට හැකි කරවන බවට හෝ එම ඡේදය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට දේශපාලන පක්ෂයක ලේකම්වරයකුට හැකි කරවන බවට මේ උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් කිසිවක් කියවා තේරුම් නොගත යුතු ය ; එම කාල සීමාවන් නම්—

(i) පාර්ලිමේන්තුව විසුරුවා හරින ප්‍රකාශනයක දිනයෙන් හෝ මේ පනත යටතේ මැතිවරණයක් පැවැත්වීමට නියම කරන නියමයක දිනයෙන් ආරම්භ වී එම ප්‍රකාශනයේ හෝ නියමයේ නිශ්චිතව දැක්වෙන ඡන්ද විමසීමේ දිනයෙන් අවසන් වන කාල සීමාව ; හෝ

(ii) 1981 අංක 15 දරන ජනාධිපතිවරණ පනතේ 2 වන වගන්තිය යටතේ නියමයක් කර ඇති දිනයෙන් ආරම්භ වී එම නියමය මගින් නියම කර ඇති ඡන්ද විමසීමේ දිනයෙන් අවසන් වන කාල සීමාව ; හෝ

(iii) 1988 අංක 2 දරන පළාත් සභා මැතිවරණ පනත යටතේ මැතිවරණයකට අදාළව එකී පනතේ 10 වන වගන්තිය යටතේ වන දැන්වීමක දිනයෙන් ආරම්භ වී එකී පනතේ 22 වන වගන්තිය යටතේ කර ඇති නියමයක, ඡන්ද විමසීමේ දිනය වශයෙන් නිශ්චිතව සඳහන් කර ඇති දිනයෙන් අවසන් වන කාල සීමාව ; හෝ

(iv) (262 වන අධිකාරය වූ ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ මැතිවරණයකට අදාළව එකී ආඥාපනතේ 26 වන වගන්තිය යටතේ වන දැන්වීමක දිනයෙන් ආරම්භ වී එකී ආඥාපනතේ 38 වන වගන්තිය යටතේ කරන ලද දැන්වීමක ඡන්ද විමසීමේ දිනය වශයෙන් නිශ්චිතව සඳහන් කර ඇති දිනයෙන් අවසන් වන කාල සීමාව ; හෝ

(v) 1981 අංක 7 දරන ජනමත විචාරණ පනතේ 2 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රකාශනයක දිනයෙන් ආරම්භ වී එම ප්‍රකාශනය මගින් නියම කරන ලද ඡන්ද විමසීමේ දිනයෙන් අවසන් වන කාල සීමාව වේ.

(ඊ) යම් වර්ෂයක ජනවාරි මාසය තුළ දී (ඈ) ඡේදය ක්‍රියාත්මකව පවතී නම්, ඡන්ද විමසීමේ දින සිට දින තිහක කාලයක් ඉකුත් වීමෙන් පසු (අ) ඡේදයේ නිශ්චිතව සඳහන් කර ඇති පරිදි සුදුසුකම් ලත් දේශපාලන පක්ෂ පිළිගනු ලැබීම සඳහා ඉල්ලුම් පත් කැඳවමින් කොමිෂන් සභාව විසින් දැන්වීමක් පළ කළ යුතු ය.

(උ) යම් දේශපාලන පක්ෂයක් සම්බන්ධයෙන් (අ) ඡේදය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමකට කොමිෂන් සභාව විසින් ඉඩ දෙනු නොලැබූ විට පළමු ඉල්ලීමට ඉඩ දෙනු නොලැබීමට අදාළ නියමයේ දින සිට අවුරුදු එකක කාලයක් ඉකුත් වන තුරු ඒ දේශපාලන පක්ෂය සම්බන්ධයෙන් ඒ උපවගන්තිය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කරනු නොලැබිය යුතු ය.

(5) යම් දේශපාලන පක්ෂයක් වෙනුවෙන් (4) වන උපවගන්තිය යටතේ යථා පරිදි ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් ලැබුණු විට කොමිෂන් සභාව විසින් අවශ්‍ය යයි සලකනු ලබන පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු—

(අ) කොමිෂන් සභාවේ මතය අනුව ඒ පක්ෂය දේශපාලන පක්ෂයක් වන්නේ නම් සහ මේ පනත යටතේ මැතිවරණවලට තරඟ කිරීම සඳහා හැකියාව ඇති පක්ෂයක් නම් ; සහ

(ආ) (i) ඒ පක්ෂය ඒ ඉල්ලීම ඉදිරිපත් කිරීමේ දිනයට අවම වශයෙන් අවුරුදු හතරක කාලයකට පෙරාතුව සිට අඛණ්ඩව දේශපාලන කටයුතුවල නියැලී සිටි බවට ; හෝ

(ii) (අ) ඒ පක්ෂය විසින් නම් කරනු ලබන අපේක්ෂකයන් දෙදෙනකු අතරින් අවම වශයෙන් එක් අපේක්ෂකයකු, ඒ පක්ෂය විසින් ඉල්ලීම ඉදිරිපත් කරන ලද දිනයට පෙරාතුව පවත්වන ලද පසුගිය පාර්ලිමේන්තු මහ මැතිවරණයේ දී ජයග්‍රහණය කර ඇති බවට ; හෝ

(ආ) ඒ පක්ෂය විසින් විවිධ පළාත් සභා පහකට නම් කරන ලද අවම වශයෙන් අපේක්ෂකයන් පස් දෙනකු අතරින් අවම වශයෙන් තුන් දෙනකු ඒ පක්ෂය විසින් ඉල්ලීම ඉදිරිපත් කරන ලද දිනයට පෙරාතුව පවත්වන ලද පසුගිය පළාත් සභා මැතිවරණයේ දී ජයග්‍රහණය කර ඇති බවට,

කොමිෂන් සභාව සෑහීමකට පත්වන්නේ නම් —

(i) මේ පනතේ විධිවිධානවලට යටත්ව මැතිවරණ කාර්ය සඳහා ඒ පක්ෂය පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස සලකනු ලැබීමට ඒ පක්ෂයට හිමිකමක් ඇති බවට ;

(ii) දේශපාලන පක්ෂය අනුමත ලකුණු අතුරින් තමාට අනුමත කරවා ගැනීමට කැමති ලකුණ වූ ද, කොමිෂන් සභාව විසින් සිය පරම අභිමතය අනුව නිශ්චය කරනු ලබන්නා වූ ද, එහෙත් එසේ සලකනු ලැබීමට හිමිකම ලැබූ වෙනත් යම් දේශපාලන පක්ෂයක අනුමත කරන ලද ලකුණ නොවන්නා වූ ද, වෙනත් යම් අනුමත කරන ලද ලකුණක් අනුමත කරන ලද ලකුණ ලෙස ඒ පක්ෂයට වෙන් කරමින්,

කොමිෂන් සභාව විසින් නියමයක් කරනු ලැබිය යුතු ය.

(6) යම් දේශපාලන පක්ෂයක නමක්, පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස සලකනු ලැබීමට, එවකටත් හිමිකම් ලබා ඇති යම් පක්ෂයක නම හා සමාන වේ නම් හෝ නොමග යැවීමට, ව්‍යාකූල කිරීමට හෝ මුලා කිරීමට හේතු වන තරමට ඒ දේශපාලන පක්ෂයේ නම එසේ හිමිකම් ලබා ඇති පක්ෂයේ නමට සමාන වන බව කොමිෂන් සභාවේ මතය වන්නේ නම් (5) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස සලකනු ලැබීමට ඒ දේශපාලන පක්ෂයට හිමිකම් නොලැබිය යුතු ය.

(7) (4) වන උපවගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් (5) වන උපවගන්තිය යටතේ කරනු ලබන නියමයක් අවසානාත්මක විය යුතු අතර, එය කිසිම අධිකරණයක දී ප්‍රශ්න කිරීමකට භාජන නොකළ යුතු ය.

(8) මේ වගන්තියේ (5) වන උප වගන්තියේ කාර්යය සඳහා දේශපාලන සන්ධානයක් මත පදනම් ව සාදන ලද යම් පක්ෂයක සම්පාදක පක්ෂයක් "ඒ පක්ෂය " යන වචනවලට ඇතුළත් වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු කරනු ලැබේ :—

"පිළිගත් දේශපාලන පක්ෂ ඇතැම් නියම අනුව ක්‍රියා කළ යුතු බව

8. (1) යම් පිළිගත් දේශපාලන පක්ෂයක ව්‍යවස්ථාවේ පිටපතක්, ඒ පක්ෂයේ නිලධාරීන්ගේ ලැයිස්තුවක් ද, ඒ පක්ෂයේ දේශපාලන වැඩසටහන ද සමග —

(අ) 7 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් පිළිගත් දේශපාලන පක්ෂයක් සම්බන්ධයෙන් වන විට, මේ පනත ක්‍රියාත්මකවීමේ දින සිට මාස තුනක් ඇතුළත ; සහ

(ආ) වෙනත් යම් පිළිගත් දේශපාලන පක්ෂයක් සම්බන්ධයෙන් වන විට 7 වන වගන්තියේ (5) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස සලකනු ලැබීමට එම පක්ෂය හිමිකම් ලැබූ දින සිට මාස තුනක් ඇතුළත,

කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම සෑම පිළිගත් දේශපාලන පක්ෂයක ම ලේකම්වරයාගේ කාර්යය වන්නේ ය.

(2) සෑම පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් ම වර්ෂයකට එක් වරක් හෝ ඒ පක්ෂයේ ව්‍යවස්ථාවේ නිශ්චිතව දැක්වෙන පරිදි මහා සභා රැස්වීමක් පැවැත්විය යුතු ය. එම රැස්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය එම ව්‍යවස්ථාවේ නිශ්චිතව දක්වා තිබිය යුතු ය.

(3) පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් එහි ව්‍යවස්ථාව සංශෝධනය කරන හෝ එහි නිලධරයන් වෙනස් කරන අවස්ථාවක, ඒ පක්ෂයේ ලේකම්වරයා විසින් සංශෝධනයේ හෝ වෙනස් කිරීමේ දින සිට දින තිහක් ගතවීමට පෙර එම සංශෝධනය හෝ වෙනස් කිරීම පිළිබඳව කොමිෂන් සභාවට දැනුම් දිය යුතු ය.

(4) ලියාපදිංචි විගණකවරයකු විසින් විගණනය කරන ලද සෑම පිළිගත් දේශපාලන පක්ෂයක ම වාර්ෂික ගිණුම් ප්‍රකාශයේ පිටපතක් කොමිෂන් සභාව වෙත භාර දිය යුතු ය.

(5) මැතිවරණ පැවැත්වීමට අදාළ ලිඛිත නීතිවල විධිවිධාන සලසා ඇති පරිදි, රජයේ සහාය ලබා ගැනීමට සෑම පිළිගත් දේශපාලන පක්ෂයකට ම හිමිකම ඇත්තේ ය.

(6) (අ) මේ පනත යටතේ කොමිෂන් සභාව වෙත පවරන ලද බලතල ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන ලිඛිත දැන්වීමක් මගින්, ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කාලය තුළ ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති ඒ දේශපාලන පක්ෂයට අදාළ තොරතුරු ඉදිරිපත් කරන ලෙස හෝ ඒ දැන්වීමේ නිශ්චිතව දැක්වෙන යම් ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස ඒ දේශපාලන පක්ෂයේ ලේකම්වරයාට නියම කරනු ලැබිය හැකිය.

(ආ) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලා ඇති තොරතුරු හෙළිදරව් කිරීමෙන් යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ පක්ෂයේ ලේකම්වරයා වළක්වනු ලැබ ඇත්නම් මිස, (1) වන උපවගන්තිය යටතේ යම් තොරතුරක් ලබා දීමට නියම කරනු ලැබ ඇති යම් දේශපාලන පක්ෂයක ලේකම්වරයකු විසින්, ඒ දැන්වීමේ නියමිත කාලය තුළ ඒ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම ඒ ලේකම්වරයාගේ කාර්යය වන්නේ ය.

(7) කොමිෂන් සභාව වෙත නියමිත ගාස්තුවක් ගෙවීමෙන් යම් දේශපාලන පක්ෂයක ව්‍යවස්ථාවක් ලබාගෙන එය කියවා බැලීමට හෝ යම් නියමිත ගාස්තුවක් ගෙවීමෙන් එම ව්‍යවස්ථාවේ සහතික කළ පිටපතක් ලබා ගැනීම හෝ යම් තැනැත්තකුට හිමිකම ඇත්තේ ය.

(8) මැතිවරණ කාලය තුළ දී දේශපාලන පක්ෂ සහ අපේක්ෂකයන් විසින් පිළිපැදිය යුතු ආචාර ධර්ම සංග්‍රහයක් කොමිෂන් සභාව විසින් කළින් කල නිකුත් කරනු ලැබිය හැකි ය.

(9) මේ වගන්තිය සහ 7 වන වගන්තිය යටතේ වූ විධිවිධාන බලාත්මක කිරීම සහ කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සාමාන්‍ය හෝ විශේෂ විධාන කොමිෂන් සභාව විසින් කළින් කල දේශපාලන පක්ෂවලට, යම් තැනැත්තකුට හෝ පුද්ගල මණ්ඩලයකට නිකුත් කරනු ලැබිය හැකි ය.”.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියට 8අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"දේශපාලන පක්ෂවල යම් සන්ධානයක් පිළිබඳව කොමිෂන් සභාව වෙත නිවේදනය කළ යුතු බව.

8අ. පිළිගත් දේශපාලන පක්ෂ දෙකක් හෝ වැඩි ගණනක් එක් කිරීමෙන් සාදන ලද යම් සන්ධානයක සම්පාදක පක්ෂවල නම් සහ එහි නිලධාරීන්ගේ නම් කොමිෂන් සභාව වෙත නිවේදනය කිරීම එම සන්ධානයේ ලේකම්වරයාගේ කාර්යය වන්නේ ය.".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"දේශපාලන පක්ෂයක් පිළිගැනීම අවසන්වීම.

9. (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, යම් පිළිගත් දේශපාලන පක්ෂයක් 8 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ දේශපාලන පක්ෂය පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස සලකනු ලැබීම අවසන් වන්නේ ය.

(2) කොමිෂන් සභාව වෙත පිළිගත් දේශපාලන පක්ෂයක ලේකම්වරයා විසින් තත් කාර්යය සඳහා ලිඛිතව කරනු ලබන ඉල්ලීමක් මත, කොමිෂන් සභාව විසින්, ස්වකීය අභිමතය පරිදි 8 වන වගන්තියේ සඳහන් කාල සීමාව දින හැටක් නොඉක්මවන තවදුරටත් වූ කාලසීමාවක් සඳහා දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(3) මැතිවරණ කාර්යය සඳහා පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස සලකනු ලැබීමට හිමිකම ඇති යම් දේශපාලන පක්ෂයක් විසින්-

(i) අනුක්‍රමික පාර්ලිමේන්තු මහ මැතිවරණ දෙකක් සඳහා ඒ පක්ෂයේ එක් අපේක්ෂකයකු හෝ නම් කරනු නොලැබුවහොත් ;

(ii) 8 වන වගන්තියේ (1) වන, (3) වන, (4) වන සහ (7) වන උපවගන්තිවල නියමයන්ට අනුකූලව ඒ පක්ෂය ක්‍රියා නොකළහොත්,

පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස පිළිගනු ලැබීමට ඒ පක්ෂයට ඇති හිමිකම අවසන් වන්නේ ය.

(4) මේ වගන්තියේ කාර්යය සඳහා දේශපාලන සන්ධානයක් මත පදනම් ව සාදන ලද යම් පක්ෂයක සම්පාදක පක්ෂයක් "ඒ පක්ෂය" යන වචනවලට ඇතුළත් වන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

6. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.